# Women - A New Paradigm in Knowledge Production

Maithree Wickramasinghe

දැනුම උත්පාදනයෙහි ස්ත්‍රීන් නැත්නම් ස්ත්‍රීය පිළිබඳ පර්යේෂකයන්ගේ දේශපාලන විඥානය සුසමාදර්ශයක් වන හෙයින් ස්ත්‍රී අධ්‍යයන පර්යේෂණ මඟින් පර්යේෂණ විධි ක්‍රමයෙහි පෙරළියක් ඇති කළ හැකි බව මෙම නිබන්ධනයෙහි මම තර්ක කරමි. මෙය ශ්‍රී ලංකාවේ ස්ත්‍රී-පුරුෂ සමාජ භාවය සහ ස්ත්‍රීවාදය සම්බන්ධ පර්යේෂණ ඇතුළත් වන කුලකය සම්බන්ධ ස්ත්‍රී පර්යේෂණ සංකල්පගත කිරීමට පෙළැඹි වන්නකි.

නිබන්ධනයක් ලිවීමෙහි ඇති සීමාවන් නිසාවෙන් මෙම තර්කයෙහි ඇති විස්තීර්ණ ගැඹුර මම සාකච්ඡා නොකරමි. එහෙත් එවැනි සුසමාදර්ශයක කේන්ද්‍රයෙහි තිබෙන්නා වූ සංකල්ප ස්ත්‍රීන්/ස්ත්‍රීය සම්බන්ධ ඥානවිභාගී, භාවිත හා දේශපාලන සඳහන් කිරීම වෙත අවධානය යොමු කරමි. ඒ අනුව ජීවිතය, සමාජය, ස්ත්‍රීන් සිටි ද නොසිටි ද දායක වූ ද නියෝජනයන් ලබයි ද යන කාරණා වෙත අවධානය යොමු කිරීමෙන් පර්යේෂණ අර්ථවත් වන්නේ කෙසේදැයි විමසීම මෙම නිබන්ධනයෙහි අරමුණ වන්නේ ය. පර්යේෂණවල ස්ත්‍රී සටහන සැලකීමේ දී මම ඇය ව බහු අර්ථයෙන් සලකන්නෙමි. ස්ත්‍රියගේ සමාජීය හා ජීව විද්‍යාත්මක කොටස් නැගීම ඒකාබද්ධයෙන් ගන්නෙමි (මවගේ භූමිකාව සම්බන්ධ සංවාදාත්මක නිදසුන ඇති ය). අවසාන වශයෙන් ස්ත්‍රීවාදයෙහි දේශපාලන ප්‍රක්ෂේපණය සඳහා මෙම ස්ත්‍රීන්/ස්ත්‍රීය සම්බන්ධ පර්යේෂණ, සක්‍රීය හා අක්‍රීය ඒකකයන් ලෙස සංකල්පගත කිරීම මම සාකච්ඡාවට ගනිමි.

ස්ත්‍රී අධ්‍යයන ක්ෂේත්‍රයන්හි, සාහිත්‍ය සමීක්ෂණයන්හි සහ ස්ත්‍රී අධ්‍යයන ලේඛන ඇසුරෙන් මාගේ විශ්ලේෂණයෙහි නිරත ව අන්‍ය පර්යේෂකයන් සමඟ සම්මුඛ ව සාකච්ඡා කිරීම, මාගේ පර්යේෂණ විධි ක්‍රමයට ඇතුළත් වන්නේ ය. මානවශාස්ත්‍ර හා සමාජ විද්‍යාවන්හි පර්යේෂණ විධි ක්‍රම ගැන උනන්දුවක් දක්වන විද්වතුන්ට සහ පර්යේෂකයන්ට මේ නිබන්ධය, මාගේ අනුවිය කාර්යයන්ගෙන් ප්‍රකාශ සටහන් කිරීමේ ක්ෂේත්‍රය හා විධික්‍රම සම්බන්ධ ව මාගේ ඇති දැඩි උනන්දුව නිසාවෙන් කිසියම් වැදගත්කමකින් යුක්ත විය යුතු ය.